## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදිව හෙළිදරව් කර නොතිබුණි.

(i). පෙර වර්ෂය හා සැසඳීමේදී තොග අගය කිරීමේ පදනමේ වෙනසක් වී නොතිබුණද, තොග අගය කිරීමේ පදනම LIFO සිට FIFO ලෙස වෙනස් වූ බව දක්වා තිබුණි.

(ii). ණයගැතියන් සඳහා බොල් ණය වෙන්කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

##### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). පාර්තෝෂික දීමනා සඳහා වෙන්කිරීම් ගණනය කිරීමේදී 1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීම් පනතේ 3(2) වගන්තිය ප්‍රකාර දළ වැටුප අදාළ කර ගතයුතු වුවත්, මූලික වැටුප පදනම් කරගෙන තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය වටිනාකම රු.6,097,818 ක් වුවද, ගිණුම්වල සටහන් කර තිබුණේ රු.1,405,561 ක් ලෙසය. ඒ අනුව මෝටර් රථ ක්ෂය රු.4,692,257 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය සඳහා විද්‍යාගාර හා තාක්ෂණික උපකරණ සඳහා ක්ෂය වටිනාකම රු.15,745,089 ක් වුවද, ගිණුම්වල රු.16,219,865 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.474,775 ක් වැඩියෙන් ක්ෂය කර තිබුණි.

(ඇ). ආයතනයකින් ලබාගන්නා ලද ප්‍රමිත අලෙවියෙන් ලැබූ රු.1,276,112 ක ආදායම ගෙවිය යුතු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂය රු.41,305,888 ක් වුවත්, ලෙජර් ගිණුම අනුව එය රු.40,820,029 ක් වී තිබුණි. ඒ අනුව රු.485,859 ක වෙනසක් විය.

(ආ). ණයගැතියන් සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට මුදල් අංශයේ උපලේඛණය අනුව රු.40,858,140 ක ශේෂයක්ද අභ්‍යන්තර විගණන අංශයේ වාර්තා අනුව රු.41,856,181 ක ශේෂයක්ද දැක්වුණු අතර, රු.998,040 ක වෙනසක් විය.

1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 756 | | වටිනාකම රු.664,289,341 ක් වූ ජංගම නොවන වත්කම් අයිතම 05 ක් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) | 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන ඉතිරි කරගත් නිවාඩු වෙනුවෙන් දීමනා හා දිරි දීමනා වශයෙන් එකතුව රු.20,842,206 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2011 සැප්තැම්බර් 13 දිනැති අංක 43(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය. | (i). | 2011 ජුලි 01 දින සිට ගැලපීමේ දීමනා ගෙවීම සම්පූර්ණයෙන් නතර කළයුතු වුවත්, ආයතනය 2012 වර්ෂය වෙනුවෙන්ද රු.166,305 ක ගැලපීමේ දීමනා ගෙවා තිබුණි. |
| | | (ii). | පාර්තෝෂික දීමනා ගණනය කිරීමේදී ගැලපීම් දීමනාව ද යොදා ගැනීම නිසා නිලධාරීන් 14 දෙනෙක් වෙනුවෙන් රු.51,662 ක් වැඩිපුර පාර්තෝෂික දීමනා වශයෙන් වෙන්කර තිබුණි. |
| (ඇ) | 2004 අගෝස්තු 31 දිනැති හා අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | | ආයතනය සතු වාහන දෙකක් ධාවනයෙන් ඉවත් කර තිබුණ ද, එය අපහරණය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.69,661,501 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපව රු.101,032,277 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.31,370,776 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෞද්ගලික පඩිනඩි රු.මිලියන 38 කින් හා අනෙකුත් වියදම රු.මිලියන 33 කින් වැඩිවීම මේ කෙරෙහි බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම සියයට 14 ක වැඩිවීමක් පෙන්නුම් කළ ද, පෙර වර්ෂයට සාපේක්ෂව සියළුම වියදම් සියයට 50 සිට සියයට 565 දක්වා පරාසයක් තුළ වැඩිවීම හේතුවෙන් අතිරික්තය සියයට 31 කින් අඩුවී තිබුණි

### 2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි.

සේවයෙන් පහ කළ සේවකයෙකු විසින් ආයතනයට එරෙහිව පවරනු ලැබූ නඩුවේ තීන්දුව පරිදි රු.1,451,323 ක වන්දි මුදලක් කම්කරු කොමසාරිස් කාර්යාලයේ තැන්පත් කර තිබුණද, එම සේවකයාගෙන් ආයතනයට අය වියයුතු රු.148,798 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 භෞතික කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ආයතනය විසින් 2012 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාර සැලැස්ම හා තත්‍ය කාර්යසාධනය සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ඉටුකළ යුතුව තිබුණු ඉලක්ක සම්පූර්ණයෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **අංශය** | **විෂයය** | **ඉලක්කය** | | **තත්‍ය කාර්ය සාධනය** | **ඉලක්කය කරා ළඟා නොවූ අවස්ථා** |
|---|---|---|---|---|---|
| | | 2012 | 2011 | 2012 | |
| අලෙවි හා ප්‍රවර්ධන අංශය | මාධ්‍ය හරහා පාරිභෝගික තොරතුරු ව්‍යාප්ත කිරීම | 20 | 14 | 12 | 08 |
| | තත්ත්ව සම්මාන පිරිනැමීම | 15 | 10 | 08 | 07 |
| තත්ත්ව සහතිකකරණ අංශය | විදේශීය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 50 | 30 | 07 | 43 |
| | මත්ස්‍ය සැකසුම් ආයතන ලියාපදිංචි කිරීම | 30 | 50 | 14 | 16 |
| පද්ධති සහතිකකරණ අංශය | සහතික ප්‍රදානය කිරීම | 160 | 140 | 145 | 15 |
| | UTZ සහතික කිරීම් | 05 | - | - | 05 |

(ආ). ඉලක්ක ලබාදීමේදී පෙර වර්ෂයට සාපේක්ෂව ඉලක්කය වැඩි කළයුතු වුවද ලබාදී ඇති ඉලක්ක තාත්වික නොවන බව නිරීක්ෂණය වේ. සමහර විෂයන් සඳහා සපුරා ගතයුතු ඉලක්කය අඩුකර තිබුණි.

(ඇ). ආයතනයේ කාර්යසාධනය වැඩිකිරීමේ අරමුණින් කාර්ය මණ්ඩලය සඳහා 2012 වර්ෂයේදී දිරි දීමනා වශයෙන් රු.36,456,522 ක් ගෙවා තිබූ අතර, පෙර වර්ෂයට වඩා ආදායම සියයට 14 කින් වැඩිවී තිබුණද වියදම සියයට 24 කින් වැඩිවී තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ). වාහන බැටරි ආනයනය කිරීමේදී ප්‍රමිති සහතික නිකුත් කිරීමේදී පහත සඳහන් අකාර්යක්ෂමතාවන් සිදුවී තිබුණි.

(i). ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන වාහන බැටරි වෙළෙඳපලට නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 1126 ට අනුකූල බවට සහතිකයක් නිකුත් කළ යුතුය. පරීක්ෂණ වාර්තා ලබාගැනීමේදී මාස 06 ක් වැනි කාලයක් ප්‍රමාදවී එම සහතික නිකුත් කර තිබුණි.

(ii). පරීක්ෂණ වාර්තාවල ප්‍රතිඵල අසතුටුදායකවී තිබූ අවස්ථා වලදීද සුළු බැහැරවීම් (Marginal Deviation ) ලෙස සළකා ආනයනික බැටරි තොග නිදහස් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි.

(ආ). පද්ධති සහතික පිරිනැමීම සම්බන්ධයෙන් පහත සඳහන් අකාර්යක්ෂමතාවයන් සිදුවී තිබුණි.

(i). ආයතනය පිහිටුවා දිගුකලක් ගතවී තිබුණත්, ආයතනයේ ආදායම් අයකිරීම යාවත්කාලීනව සිදුකිරීම සඳහා පරිගණක ගතකළ දත්ත පද්ධතියක් (Data Base ) ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii). තත්ත්ව කළමනාකරණ පද්ධති සහතික ක්‍රමයේ පරිපාටි 8.1 ඡේදය හා ISO:9001 පද්ධති සහතිකකරණ ගිවිසුමෙහි 3.2 ඡේදය අනුව පද්ධති සහතිකය ලබාගත් ආයතන සඳහා මාස 12 කට වරක් සිදු කළයුතු අන්වේක්ෂණ පරීක්ෂාව විවිධ හේතු දක්වමින් සිදු කර නොතිබුණි.

(iii). ISO:9000 හා ISO:14000 සහතික ලබාගත් ආයතන 31 කින් රු.2,724,253 ක මුදලක් අයවීමට තිබුණත්, මීට අදාළ ලිපිගොනු විනාශ කර තිබීම නිසා හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවී තිබුණි.

(ඇ). ශ්‍රී ලංකා ප්‍රමිති 107:2008 ට අනුව සිමෙන්තිවල සම්පීඩිතා අගය 42.5 ට අඩුවී තිබුණු කිලෝග්‍රෑම් 591,905,000 කට ආසන්න සිමෙන්ති තොග වෙළෙඳපොලට නිකුත් කර තබුණි.

(ඇ). ප්‍රමිති ආයතනය විසින් 2012 දෙසැම්බර් 31 දින දක්වා විවිධ භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති 1448 ක් හඳුන්වාදී තිබුණි. යම්කිසි භාණ්ඩයකට ප්‍රමිති සහතිකයක් ලබාදීමේදී එම ප්‍රමිතියේ සඳහන් සියළු අවශ්‍යතා සපුරාලිය යුතු වුවද, විවිධ හේතු ඉදිරිපත් කරමින් ප්‍රමිතියේ අවශ්‍යතා වලින් බැහැරව ප්‍රමිති සහතික ලබාදී තිබුණි.

(ඉ). එස්එල්එස් සහතිකය අවලංගු කළ ආයතනයකට එම සහතිකය නැවත වලංගු කිරීම සඳහා වන ක්‍රියාපරිපාටියෙන් බැහැරව බලපත්‍ර කමිටු තීරණ අනුව සහතිකයේ වලංගු කාල සීමාව දීර්ඝ කර තිබුණි.

(ඊ). එක්තරා වෙළෙඳනාමයක් යටතේ 2011 සැප්තැම්බර් 15 සිට 2012 අප්‍රේල් 20 දක්වා අවස්ථා 22 කදී ආනයනය කරන ලද සිමෙන්තිවලින් අවස්ථා 18 කද නියමිත ප්‍රමිතියට අනුකූලවී නොතිබුණු සිමෙන්ති කි.ග්‍රෑම්.12,208,000 ක් වෙළෙඳපලට නිකුත් කර තිබුණි.

(උ). සිමෙන්ති පිළිබඳ මාර්ගෝපදේශ TG-CP-06 හි 3.1 ඡේදය අනුව මාස 03 ක් ඇතුළත ආනයනය කළ සිමෙන්ති තොග 03 ක් නියමිත ප්‍රමිති පිරිවිතරයට නොමැතිවීම හෝ ආනයනික තොග 10 කින් තොග 03 ක් නියමිත ප්‍රමිති පිරිවිතරයන්ට අනුකූල නොවේ නම් සිමෙන්ති සඳහා වූ බලපත්‍රය තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කළයුතු වුවත්, එසේ නොකර ප්‍රමිතියට අනුකූල නොවූ සිමෙන්ති ආනයනය කිරීමට ඉඩ සළසා දී තිබුණි.

3.3 හඳුනාගන්නා ලද පාඩු

ආදායම් සඳහා ලැබුණු චෙක්පත් අගරුවීම නිසා රු.489,610 ක අලාභයක් ආයතනයට සිදුවී තිබුණි. මෙම චෙක්පත් අගරුවීමේ කාලය වර්ෂ 01-19 දක්වා වූ කාල පරාසයකට අදාළ විය.

3.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

(අ). පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා ගුණාත්මක නිෂ්පාදන (GMP) සහතිකපත් ලබාදීම සඳහා පොල් සංවර්ධන අධිකාරියෙන් රු.1,400,000 ක් ලැබී තිබුණි. ආයතන 44 කට GMP සහතික ලබාදීම ව්‍යාපෘතියේ අරමුණ වුවද, 2013 මැයි වනවිට ද ලබාදී තිබුණේ සහතික 11 ක් පමණි.

(ආ). ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට තත්ත්ව සහතික ලබාදීම සඳහා 2005 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ අරමුදල් වලින් ඉතිරිව තිබූ රු.4,079,759 ක මුදල අක්‍රීයව ජංගම ගිණුමේ රඳවා තිබුණි.

3.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

2003 ජූනි 02 දිනැති අංක.පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව ආයතනයේ කාර්යමණ්ඩලයේ නිලධාරීන් 07 දෙනෙකු වෙනත් ආයතනවල සේවයේ යොදවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.1,084,086 ක් ආයතනය විසින් වැය කර තිබුණි.

3.6 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අඛණ්ඩව වැටුප් රහිත නිවාඩු ලබාගන්නා නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගෙන නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසය දක්වා වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණු නිලධාරීන් තිදෙනෙකු සති අන්තවල සේවයේ යොදවා තිබුණි.

(ඇ). ආයතනයේ අරමුදල් වලින් විවිධ අධ්‍යයන පාඨමාලා හදාරන ලද නිලධාරීන් විසින් එම පාඨමාලා නිසි පරිදි අවසන් කර සුදුසුකම් සපුරා ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i). නිලධාරියෙකු විසින් 2009 අප්‍රේල් 01 දින සිට 2009 සැප්තැම්බර් 30 දින දක්වා පින්ලන්තයේ පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා රු.276,560 ක ගිවිසුම් හා බැඳුම්කරයකට එළඹ තිබුණ ද, 2013 මාර්තු 31 දින වනවිටත් පශ්චාත් උපධිය ලබාගෙන නොතිබුණි.

(ii). ආයතනයේ නිලධාරීන් තිදෙනෙක් සඳහා 2008/10, 2009/10 හා 2011 අධ්‍යයන කාල සඳහා රු.509,005 ක පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා ගාස්තු ගෙවා තිබූ අතර, 2013 මාර්තු 31 දින වනවිටත් එම උපාධි ලබාගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

(අ). තොග පාලනය.
(ආ). ණයගැති පාලනය.
(ඇ). ආදායම් අයකිරීම.
(ඈ). කාර්යමණ්ඩල පාලනය.